මගේ අංකය : උප/09/FRM/චක්‍රලේඛ/2015 16.01.2015

**පළාත් චක්‍රලේඛ අංක : PF/01/2015**

පළාත් ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානින්,
උතුරු පළාත.

## <u>රජයේ ආයතනයන්හි හා නිලධාරීන් සඳහා දුරකථන පහසුකම් සැපයීම හා බිල්පත් නිරවුල් කිරීම</u>

ඉහත මැය සම්බන්ධයෙන්, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ අංක 03/2014 හා 2014.12.30 දින දරණ චක්‍රලේඛය ප්‍රකාර.

1. නව දුරකථන ගාස්තු සීමාවන් 01.01.2015 දින දක්වා ක්‍රියාත්මක කිරීම සඳහා,

    I. රාජකාරි කාර්යාල දුරකථන සඳහා බිල්පත් පමණක් පහත සඳහන් වගුවේ (111) (අ) ලෙස සඳහන් පරිදි නිලධාරියාට හිමි උපරිම වියදම් සීමාව තුළ කාර්යාලය විසින් ගෙවීමට කටයුතු කළ යුතුයි.

    II. රාජකාරි නිවාස ජංගම දුරකථන අන්තර්ජාල සම්බන්ධතාවයන් සඳහා වූ වියදම් නිලධාරියා විසින් පියවීම සඳහා වගුව (111) (ආ) හි සඳහන් පරිදි අදාළ නිලධාරියාට මාසික දීමනාවක් වැටුප සමඟ ගෙවිය යුතුයි

| I | II | III | |
|---|---|---|---|
| කාණ්ඩ | නිලධාරි කාණ්ඩය | උපරිම වියදම් සීමාව (සියලුම බදු හා මාසික ගස්තු ඇතුලත්ව) රුපියල් | |
| | | (අ) | (ආ) |
| | | රාජකාරි කාර්යාල දුරකථනය | රාජකාරි නිවාස දුරකථනය/ජංගම දුරකථනය/අන්තර් ජාල සම්බන්ධතාව සඳහා නිලධාරියාට ගෙවන දීමනාව |
| 1 | පළාත් ප්‍රධාන ලේකම් | 5,000.00 | 10.000.00 |
| 2 | පළාත් අමාත්‍යාංශයේ ලේකම්වරුන්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් හා සම හා ඉහල තත්ත්වයේ නිලධාරින් | 3,500.00 | 7,000.00 |
| 3 | පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා සම තත්ත්වයේ නිලධාරීන් | 2,500.00 | 5,000.00 |
| 4 | නියෝජ්‍ය අධ්‍යක්ෂ, නියෝජ්‍ය කොමසාරිස්වරුන් හා සම තත්ත්වයේ නිලධාරීන් | 2,000.00 | 4,000.00 |
| 5 | සහකාර අධ්‍යක්ෂවරුන්,සහකාර ලේකම්වරුන්,සහකාර කොමසාරිස්වරුන්,හා සම තත්ත්වයේ නිලධාරින් | 2,000.00 | 2,000.00 |
| 6 | පරිපාලන නිලධාරීන් | 1,000.00 | 1,000.00 |
| 7 | පළාත් ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය මත මාණ්ඩලික නොවන නිලධාරීන් | 1,000.00 | Nil |

2. ඉහත දුරකථන පහසුකම් හිමි නිලධාරීන්ට අදාළ දුකථන බිල්පත් නිරවුල් කිරීම හා මාසික ගෙවීම් සඳහා වූ දීමනාවන් 2015 වර්ෂය සඳහා වූ අයවැයෙන් අනුමත ප්‍රතිපාදන සීමාව තුළ කළ යුතුයි. ඒ සමගම මෙම දීමනාවන් සම්බන්ධයන් අතිරේක මුදල් ප්‍රතිපාදන කිසිවක් ලබාදීමට කටයුතු කරනු නොලැබේ.

3. තවද කාර්යාල සඳහා නව දුරකථන සම්බන්ධතාවයන් ලබා ගැනීමේදී හා අනෙකුත් මාණ්ඩලික නොවන නිලධාරීන්ට සන්නිවේදන පහසුකම් ලබාදීමේදී ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතුයි.

4. ඉහත චක්‍රලේඛයේ සඳහන් අනෙකුත් විධිවිධානයන් කෙරෙහි ඔබගේ අවධානය යොමු කරන අතර මෙම විෂය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2010.09.01 දින දරණ 446 අංකය දරණ චක්‍රලේඛය හා 2011.11.15 දින හා අංක 1 දරණ චක්‍රලේඛයන් ඉහත චක්‍රලේඛය මගින් අවලංගු කරන බව දන්වා සිටිමි.

ආර්. විජයලඩසූමි,
ප්‍රධාන ලේකම්.

පිටපත්:

1. ගරු ආණ්ඩුකාර ලේකම් - උ.ස - ගරු ආණ්ඩුකාරතුමාගේ දැ.ගැ.ස
2. සහකාර විගණකාධිපති ජනරාල් - උ.ස } දැ.ගැ.ස
3. ප්‍රධාන අභ්‍යන්තර විගණකාධිපති - උ.ස } දැ.ගැ.ස